# මෙය අපගේ විශ්වවිද්‍යාලයයි

අග්නිදිග විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යාපනය ලැබීමට ඔබගේ දරුවාට ලැබුණු මෙම වටිනා අවස්ථාව සතුටට කරුණකි. ශ්‍රී ලංකාවේ පවත්වනු ලබන තරග විභාගයකින් ඔබගේ දරුවා ලබාගත් ජයග්‍රහනය උතුම් අවස්ථාවක් බැවින් ඔබ සැම වාසනා වන්තයෝ වේ. ඔබට ලැබුණු මෙම අවස්ථාව හොඳින් ප්‍රයෝජනයට ගෙන මෙම විශ්වවිද්‍යාලයේ කීර්තිය ඔසවා තබමින් මෙම ආයතනය සතු සියලුම සම්පත් භාවිතා කර රටට යහපත් පුරවැසියන් හා නායකයන් වීමට ඔවුන්ගේ සුදුසුකම් වර්ධනය කර අනාගතය දීප්තිමත් කර ගැනීමට හැකි වේවා යැයි සුබ පතමු. නැගෙනහිරින් මහ මුහුද හා බටහිරින් සරුසාර කෙත් බිම් උරුමකරගත් මෙම විශ්වවිද්‍යාලය ඔබ සැම සාදරයෙන් පිළිගනී.

මෙම විශ්වවිද්‍යාලය සම්බන්ධව කරුණු කිහිපයක් ඔබ සමග බෙදා ගැනිමට මෙය හොඳ අවස්ථාවක් යැයි අපි විශ්වාස කරමු.

- මෙම විශ්වවිද්‍යාලයේ විශිෂ්ටත්වය පෙන්නුම් කරන ප්‍රධාන කරුණක් නම් සියලු ආගම් හා සංස්කෘතීන් ආවරනය වන පරිදි මෙම ශිෂ්‍ය පරපුරට කිසිදු වෙනස්කමකින් තොරව සුහදව තමන්ගේ අධ්‍යාපන කටයුතු හැදෑරීමට අවස්ථාව සලස්වා දී තිබීමයි.

- අප විශ්වවිද්‍යාලය කලා හා සංස්කෘතික, වානිජ හා කලමණාකරන, ව්‍යවහාරික විද්‍යා, ඉංජිනේරු, තාක්ෂණික හා ඉස්ලාම් හා අරාබි යනාදී පීඨ හයකින් සමන්විත වේ.

- අප විශ්වවිද්‍යාල භූමිය තුළ බෞද්ධ, හින්දු, ඉස්ලාම් හා ක්‍රිස්තියානි ආගමික සිද්ධස්ථාන පිහිටා තිබීම විශේෂ කරුණකි.

- ලක්ෂයකට අධික පොත් පත් සමගින් අංග සම්පූර්ණ පුස්තකාලයක් විශ්වවිද්‍යාලය තුළ පිහිටා තිබීම විශේෂත්වයකි.

- ශිෂ්‍යයන් දෙදෙනකුට එක් පරිගණකයක් බැගින් විශ්වවිද්‍යාලය තුළ පරිගණක පද්ධතියක්ද, සියලු සිසුන්ට නොමිලේ Wi-Fi හා අන්තර්ජාල පහසුකම් ද ලබා දී තිබේ.

- නේවාසිකාගාර පහසුකම් ලැබිය යුතු සියලු සිසුන්ට විශ්වවිද්‍යාලය තුලම සැම වසරකම නේවාසික පහසුකම් සපයා දී ඇති එකම විශ්වවිද්‍යාලය මෙය වන අතර පිටස්තර සබඳතාවලින් තොරව මේවා පිහිටා තිබීම විශේෂ කරුණකි. එමෙන්ම සැම පීඨයකම හා නේවාසිකාගාරයකම ආපන ශාලා පහසුකම් සපයා ඇති අතර සාධාරණ මිල ගණන් යටතේ ගුණාත්මක සේවාවක් සඳහා අවශ්‍ය වටපිටාව ද සලසා ඇත.

- සිසුන්ගේ ක්‍රිඩා කුසලතා වර්ධනය කර ගැනිම සඳහා ඒ සඳහාම වෙන්වූ ගොඩනැගිල්ලක් පිහිටා ඇති අතර මෙහිදි කැරම්, චෙස්, කරාටේ, තයිකොන්ඩු, මේස පන්දු, දැල් පන්දු හා බැඩ් මින්ටන් ආදි ක්‍රීඩාවන් ක්‍රීඩා කිරිමේ පහසුකම් සලසා දී තිබේ. තවද ක්‍රිඩා කුසලතා ප්‍රවර්ධනය සඳහා ක්‍රිඩා පිටි හා කායවර්ධන මධ්‍යස්ථානයක්ද ස්ථාපනය කර ඇත. ඒ සමග

ක්‍රීඩකයන්ගේ ක්‍රීඩා කුසලතා වර්ධනය කර ගැනිමට ක්‍රීඩා උපදේශක කමිටුවක් පත්කර තිබේ.

- විශ්වවිද්‍යාලය තුළ සිසුන්ගේ සෞඛ්‍යය අවශ්‍යතා සපුරාලිම සඳහා වෛද්‍ය ඒකකයක් පිහිටා ඇති අතර පැය 24 පුරාම ක්‍රියාත්මක වන ගිලන් රථ සේවාවක් (හදිසි ඇමතුම් අංක- 077 3310007 ) ක්‍රියාත්මක වේ.

- සිසුන්ගේ මානසික ගැටලු සම්බන්ධව ඔවුන්ට උපකාර කිරිම සඳහා උපදේශන සේවා ඒකකයක් පිහිටුවා තිබේ.

- මෙම විශ්වවිද්‍යාලය නවක වදයෙන් තොර ආයතනයක් ලෙස පවත්වා ගැනිම සඳහා පරිපාලනය ක්‍රියා කරයි. එවැනි සිදුවිම් සිදුවුවහොත් ඒ සඳහා ක්‍රියාත්මක වීම සඳහා පැය 24 පුරාම ක්‍රියාත්මක විශේෂ මෙහෙයුම් කමිටුවක් පත්කර ඇත. (ඇමතුම් අංක - 0779080707) මෙම අංකය හෝ පහත දී ඇති අංක හරහා හෝ තොරතුරු ලබාදෙන පුද්ගලයින්ගේ අනන්‍යතාවය ඉතා රහසිගතව ආරක්ෂා කර එම වැරදිකරුවන්ට එරෙහිව නිතිමය ක්‍රියාමාර්ග ගැනීමට විශ්වවිද්‍යාලය බැඳී සිටී. නවක වද සම්බන්ධ ඕනෑම පැමිණිල්ලක් පහත අංක වලට හෝ වෙබ් අඩවියට දැනුම් දිය හැක.

01 ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක (ඔලුවිල්) - 077 2226131
02 ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක (සමන්තුරය) - 077 3514014
03 මා(ර්)ෂල් - 077 2144811
04 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නවක වදය හා සම්බන්ධ පැමිණිලි ඉදිරිපත් කිරීමේ බිහිදොර - 011 2123700
- 011 2123456
- www.eugc.ac.lk/rg/

සියලු සම්පත් වලින් අනූන මෙම විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලබාගැනීම සඳහා පැමිණි ඔබගේ දරුවා තමන්ගේ අනාගතය හොඳින් ගොඩ නගාගෙන රටට යහපත් පුරවැසියකු ලෙස ජීවත් වෙනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.


ආචාර්ය ඒ. රමීස්
අධ්‍යක්ෂ
ශිෂ්‍ය උපකාරක සේවා හා සුබසාධන අංශය
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය
ඔලුවිල්

මහාචාර්ය එම්.එම්.එම් නාජිම්
උපකුලපති
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය
ඔලුවිල්

**Tp**: 0772849479 / 0672255389
**E-mail:** aramees2001@gmail.com
directorsssw@gmail.com